# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2481/24 - 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2026.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: NIDS/LND/ACQ/II.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4/3/9/2012/WS/86.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් වල විස්තර:-*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළයේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ පහළ කරවිට ග්‍රාම නිලධාරි වසමේ, නිරිඇල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත 2024.05.12 දිනැති කැඩැස්තර සිතියම් අංක 620389 කලාප අංක 01, පත්‍ර අංකය 01 දරන පිඹුරේ කැබලි අංක 01 - 09 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2011 ක් පමණ වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: විනායනමූර්ති ප්‍රියංකා; ප්‍රමාණය: හෙක්. 0.0202.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: -; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.1054.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: අගලවත්ත වැව්ලි සමාගම; ප්‍රමාණය: හෙක්. 0.0015.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: දම්මගේවත්ත; හිමිකම් කියන්නා: හේවාගමගේ ධර්මපාල; ප්‍රමාණය: හෙක්. 0.0111.

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: හේවාතන්ත්‍රිගේ ඩෙරල් ඔගස්ටස් ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0111.

06. **කැබලි අංක 06**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: ජයවර්ධන ආරච්චිලාගේ පොඩි හාමිනේ; ප්‍රමාණය: හෙක්. 0.0182.

07. **කැබලි අංක 07**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: ගගඅද්දරවත්තේ නවීන් සුරංග ජයනාත්; ප්‍රමාණය: හෙක්. 0.0131.

08. **කැබලි අංක 08**
ඉඩමේ නම: දම්මගේවත්ත; මුල් හිමිකම් පාන්නා: ජයවර්ධන ආරච්චිලාගේ නන්දවතී; ප්‍රමාණය: හෙක්. 0.0149.


1A - G 046520 - 27 (2026/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

09. **කැබලි අංක 09**

ඉඩමේ නම: දම්මගේවත්ත; හිමිකම් කියන්නා: සොයා ගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0056.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.06.01 වැනි දින පෙ.ව. 11.00 ට නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.05.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ජී. ඩබ්. රංජිත් ජයලාල්,**
ප්‍රාදේශීය ලේකම්,
නිවිතිගල.

2026 මාර්තු මස 24 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0222

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: EHE/DS/LND/05/ACQ/DST/03.
*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*: 4-3/15/2017/VE/396.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 126D, ඇහැලියගොඩවත්ත ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 666හි අතිරේක අංකය 6, පත්‍ර අංක 6 හා 2023.03.03 දිනැති මුලික පිඹුරේ කැබලි අංක 655 වශයෙන් පෙන්නුම් කර ඇති ඇහැලියගොඩ වතුයාය ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6977 ක් පමණ වූ 135 සහ 164 වැනි බිම් කැබලි වල කොටස්.

**මුල් හිමිකම් කියන අය: සීමාසහිත පුස්සැල්ලාව වැවිලි සමාගම.**

මායිම්

*උතුරට*: කැබලි අංක 652, 654, 135, 651, 656 සහ 657; *නැගෙනහිරට*: කැබලි අංක 135, 654, 651, 656, 657, 660 සහ 658; *දකුණට*: කැබලි අංක 658, 659, 135, 657, 164, 656, 654 සහ 653; *බටහිරට*: කැබලි අංක 658, 659, 135, 657, 164, 656, 654, 653 සහ 652.

**මුල් හිමිකම් කියන අය: සීමාසහිත පුස්සැල්ලාව වැවිලි සමාගම.**

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.06.15 වැනි දින පෙ.ව. 10.00 ට ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.06.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. ඒ. දිල්රුක්,**
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2026 මාර්තු මස 19 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.